# මගේ පුංචි කාසි කැටේ



නෙතුෂි සෙහන්සා හේරත්

කෘතියේ නම - මගේ පුංචි කාසි කැටේ

ප්‍රථම මුද්‍රණය - 2025.02.08

කතාව සහ චිත්‍ර - නෙතුෂි සෙහන්සා හේරත්

කතෘගේ ලිපිනය - අංක 179/21,
පට්ටියකැලේ වත්ත,
අම්පිටිය

කතෘගේ වෙනත් කෘති- වලස් පැංචා
කතා කරන ඔරලෝසුව

පාසල - මහමායා බාලිකා විදුහල

ශ්‍රේණිය - 2 ශ්‍රේණිය B

පරිගණක අක්ෂර හා පිටු සැකසුම : ඕෂධී එන්ටර්ප්‍රයිසස්,
2 G,
සිගෝ ප්ලාසා,
තලාතුඔය.

ISBN: 978-624-208-451-0




# පිදුම

මගේ ආදරණීය

මහමායා බාලිකා අම්මාට

මෙම පොත


ආදරයෙන් පුදමි.





ඔන්න
එකමත්
එක කාලෙක
මන්දාකිණි
කියලා
දුප්පත්
ළමයෙක්
හිටියා.

එක දවසක් ඇයගේ
තාත්තා කඩේට ගොස්
කැටයක් ගෙනාවා.







මන්දාකිණී
පුදුම වුණා.
ඇය
තාත්තාට
ස්තූති කළා.



තාත්තා ඇයට කාසි
දුන්නා. ඇය
ඒ කාසි
ගණන් කර කර
කැටයට දැමුවා.



අම්මා සමඟ
පොළේ ගිය
විට අම්මා ළඟ
ඉතිරි වන කාසි
ඉල්ලාගෙන කැටයට
දැමුවා.



දවස් ගෙවිලා ගියා.
කැටේ ටිකෙන් ටික
පිරුණා. මන්දාකිණිට
සතුටු හිතුණා.




දවසක් මන්දාකිණිග් පාසලේ පොත් ප්‍රදර්ශනයක් තිබුණා.



මන්දාකිණිට
පොතක් ගන්න
හරිම ආසා
හිතුණා.



ඇය පොතක් ගන්න අම්මාගෙන් සල්ලි
ඉල්ලුවා. ඒත් අම්මා ළඟ සල්ලි තිබුණේ නෑ.





මන්දාකිණිට දුක හිතුණා. ඇය දුකින් කල්පනා කළා. ඇයට අදහසක් ආවා. ඇයට කැටේ මතක් වුණා.





ඇය අම්මා ළඟට දුවගෙන ගියා. '' අම්මේ මම කැටේ කඩලා පොතක් ගන්නද?''

මන්දාකිණි ඇසුවා.

අම්මාගේ ඇස් වල කඳුළු පිරුණා. අම්මා මන්දාකිණිගේ ඔලුව අත ගා,

'' හා පුතේ'' කිව්වා.



මන්දාකිණී කැටේ
කඩලා පොතක්
ගත්තා. ඇයට හරිම
සතුටක් දැණුනා.



නෙතුෂි සෙහන්සා හේරත්

2 ශ්‍රේණිය B

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව (2014) වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්විමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN: 978-624-208-451-0